රක්වාන ලැගුම්හලකට පෙම්වතා සමඟ පැමිණ, එම ලැගුම්හලේදී මිය ගොස් සිටි තරුණියගේ සිදුවීම වෙත පුළුල් මාධ්‍ය අවධානයක් යොමුවී තිබිණි. එය දිවි තොර කර ගැනීමක්ද ඝාතනයක්ද යන්න නිශ්චිතවම ආවරණය වී නොමැති තත්ත්වයක් තුල වුවද එය වාතර්‍ා කිරීමේදී මාධ්‍ය විශේෂ ප්‍රවේසමක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. මන්දයත්, එය දිවි තොර කර ගැනීමක් ද විය හැකි බවට ඉදිරිපත් වන කරුණු, අනුකාරක සිදුවීම් වලට මඟ පෑදිය හැකි බැවිනි.

මේ සම්බන්ධයෙන්, දිනමිණ පුවත්පත (ජුලි 10, 2023) වාතර්‍ා කර තිබූ ආකාරය වෙත විශේෂයෙන්ම අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

* මෙහි දිවි තොරකර ගත් බවට සැක කරන ආකාරය සිරස්තල තුළ දක්වා ඇත.
* මිය ගිය තරුණියගේ ඡායාරූපයක් පළ කර ඇත.
* ඇය මිය යෑමට පෙර ලියූ බවට පැවසෙන ලිපියේ කොටස් සිරස්තල තුළම පළ කර ඇත.
* උපකාරක අංක සඳහන් කර නැත.

1) දිවි තොර කරගැනීමක් ද විය හැකිය යන කෝණයෙන් දැක්වෙන සිදුවීමක් මෙසේ වාතර්‍ා කිරීම, දිවි තොරකර ගැනීමේ නැඹුරුතාවක් ඇති අය වෙත අනුකාරක සිදුවීම් සඳහා පෙළඹවීමක් ඇති කරනා සුළු නොවේද?

2) මෙවැනි පුවත් වාතර්‍ාවක් සමඟ වුවත් හදිසි උපකාරක අංක පළ කිරීමෙන්, තවත් ජීවිත බේරාගැනීමට සහ අනුකාරක සිදුවීම් වැළැක්වීමට සහායක් නොලැබෙනු ඇතිද?

3) ඒ අනුව, මෙම දිනමිණ පුවත කෙතරම් වගකීම් සහගතව ඉදිරිපත් කිරීමට හැකියාව තිබුණා කියා ඔබ සිතන්නේ ද?

උපකාරක අංකයක් පළ කරමු. ජීවිතයක් රැක ගනිමු.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාගර්‍යෙන් සම්බන්ධ කරගත හැක)

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර්‍ කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!